# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# Annual Report

# 2015



කම්කරු දෙපාර්තමේන්තුව

**தொழில் திணைக்களம்**

**Department of Labour**

# වාර්ෂික වාර්තාව
# 2015

# පටුන


| | | පිටුව |
|---|---|---|
| | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය | 3 |
| | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමාගේ පණිවුඩය | 4 |
| | කම්කරු කොමසාරිස් ජනරාල්තුමියගේ පණිවුඩය | 5 |
| 01. | කම්කරු දෙපාර්තමේන්තුව | 6 |
| 02. | කම්කරු පරීක්ෂණ | 9 |
| 03. | වැටුප් සේවා කොන්දේසි මගින් සේවක ප්‍රජාවට සුරක්ෂිතතාවය | 13 |
| 04. | සමාජ ආරක්ෂණය උදෙසා ක්‍රියාත්මක වැඩසටහන් | 14 |
| 05. | කාන්තා හා ළමා කටයුතු උදෙසා දැක්වූ දායකත්වය | 17 |
| 06. | කර්මාන්තමය සුරක්ෂිතතාව වෙනුවෙන් ඉටුකළ මෙහෙවර | 19 |
| 07. | සැලසුම්, පර්යේෂණ, පුහුණු, ප්‍රකාශන සහ සංඛ්‍යාලේඛන | 23 |
| 08. | කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය | 25 |
| 09. | සංඛ්‍යාලේඛන සංග්‍රහය | 28 |
| 10. | ඇමුණුම | 36 |

## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



පෞද්ගලික අංශයේ සේවකයන්ට බලපාන කම්කරු නීති අණ පනත් ක්‍රියාත්මක කරනු ලබනු ප්‍රධානතම රාජ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වන අතර සමස්ත පෞද්ගලික අංශයට බලපාන කම්කරු නීති අණ පනත් 63ක් ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරයවේ.

මීට අමතරව කාර්මික ආරවුල් විසඳීම, වැඩවර්ජන වලට මැදිහත්ව පාර්ශවයන් සමථකරණය, සමාජ කතිකාවත ප්‍රවර්ධනය, සාමූහික ගිවිසුම් වලට එළඹීමට අවශ්‍ය මැදිහත් වීම, කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාල ශ්‍රම ප්‍රමිතීන් සැකසීම සහ නියාමනය, සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සහ අධීක්ෂණය, ළමා හා කාන්තාවන් සේවය යෙදවීම සම්බන්ධ නීතිමය කටයුතු සහ සන්නිවේදන කාර්යභාරය, කර්මාන්ත අංශයෙහි වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යමය ආරක්ෂාව සඳහා විධිමත් ක්‍රමවේදයන් හඳුන්වා දීම ආදී වූ පුළුල් විෂය ක්ෂේත්‍රයක් දෙපාර්තමේන්තුව මඟින් ආවරණය කරනු ලැබේ.

නව ලොවට ගැලපෙන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම කාලීන අවශ්‍යතාවයක් වන අතර වර්තමානයේ එය මහජන හිතකාමී දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.

කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීමට සහය දුන් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පිරිනමන අතර සිය කාර්යයන් අඛන්ඩව සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න

*කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය*

## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමාගේ පණිවුඩය



දේශිය ආර්ථිකය ශක්තිමත්ව ගොඩනැගීම සඳහා එම රටෙහි නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ සේවා සේවක දෙපාර්ශවය අතර ඇතිවන මනා සබඳතාවය තුළින් ගොඩනැගෙන කාර්මික සාමය අත්‍යවශ්‍ය සාධකයක්වේ. මෙම දෙපාර්ශවය අතර ඇතිවන නොගැලපීම් සහ ආකල්පමය බලපෑම් හේතුවෙන් විවිධ ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වී එමගින් ඇතිවන සෘණාත්මක බලපෑම් හේතුවෙන් කාර්මික සාමය බිඳ වැටී රටෙහි සමස්ත ආර්ථිකයම පසුගාමී විය හැකිය.

ඒ අනුව කම්කරු සුභසාධනය හා ප්‍රවර්ධනය උදෙසා සුසැදි අණපනත් ක්‍රියාවට නංවමින් කම්කරු පරීක්ෂණ සිදු කරමින් කම්කරු ප්‍රජාව පාදක කරගත් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සහ කම්කරු ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් අතර සමාජ කතිකාවත ප්‍රවර්ධනය කරමින් කාර්මික සාමය තහවුරු කිරීමේ සුවිසල් කාර්යයභාරය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව උරදී සිටී.

තම ආයතනයෙහි 2015 වර්ෂයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියාකල කම්කරු කොමසාරිස් ජනරාල්තුමිය වෙත මාගේ උණුසුම් සුභ පැතුම් පිරිනමන අතර දෙපාර්තමේන්තුවේ සියළු කාර්යයන් සාර්ථක කර ගැනීමට සහය දුන් කාර්ය මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පුදකර සිටිමි.

එස්. එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්

*කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය*

## කම්කරු කොමසාරිස් ජනරාල්තුමියගේ පණිවුඩය



කම්කරු දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඔබ වෙත සතුටින් පිරිනමමි. වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ මෙහෙවර සංක්ෂිප්තව ඉදිරිපත් කරනු ලබන මෙම ප්‍රකාශනය කම්කරු සබඳතා සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන්ට මහත් සේ උපකාරී වනු ඇත.

සේවක, සේව්‍ය හා රාජ්‍ය යන ත්‍රෛපාර්ශවීය සම්මුතියෙන් ගොඩනැගෙන කාර්මික සාමය පවත්වාගෙන යාම තුලින් ජාතික ආර්ථිකයේ වර්ධනය කෙරෙහි කම්කරු දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙම වසර තුළදී ද ලබා දීමට හැකි විය. කම්කරු ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා කම්කරු නීති අණපනත් වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි ප්‍රමුඛතාවයදී ක්‍රියා කළ වසරක් වන අතර එහිදී විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ අවම වැටුප රුපියල් දස දහසක් දක්වා වැඩි කිරීමටත් අයවැය  සහන දීමනාව සම්බන්ධව පණත් නීතිගත කිරීමට හැකි වීමත් විශාල කර්තව්‍යයකි.

2013 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයෙන් නියමු ව්‍යාපෘතියක් ලෙස ළමා ශ්‍රමයෙන් තොර  කලාපයක් බවට පත් කිරීමේ වැඩසටහන 2015 වර්ෂය වන විට මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ක්‍රියාවට නැංවිය හැකි විය. 2015 වර්ෂයේ ලෝක ළමා දිනයට සමගාමීව කොළඹ, බදුල්ල හා යාපනය දිස්ත්‍රික්කයන්හි ළමා ශ්‍රම විරෝධී වැඩසටහන් සංවිධානය කරන ලද අතර සියළු පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා ඒකාබද්ධ සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර ඇත.

මීට අමතරව , ශ්‍රී ලංකාවේ විශාලතම ප්‍රතිලාභ අරමුදල වන සේවක අර්ථ සාධක අරමුදලේ නව ව්‍යාපෘතියක් ලෙස 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම 2015 මැයි මස සිට ආරම්භ කිරීමට හැකි වීම කම්කරු දෙපාර්තමේන්තු ඉතිහාසයේ සුවිශේෂී ජයග්‍රහණයකි. තවද සේ.අ.අ. සාමාජිකයන්ට තම ගිණුමේ ශේෂය තමන්ටම පරීක්ෂා  කර ගත හැකි වන පරිදි යන්ත්‍ර සවි කිරීමේ කටයුතු කිරීම තුළින් සුවහසක් ශ්‍රමිකයන්ට පහසුකම් සැලසීමට හැකි විය.

සමාජ කතිකාවත ප්‍රවර්ධනය තුළින් වඩාත් යහපත් සේවක සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට හැකි වීම කම්කරු දෙපාර්තමේන්තුව මෙම වසරේද ප්‍රයත්න  දරන ලද අතර සමාජ කතිකාව හා වැඩපොල සහයෝගීතාව පිළිබඳ දීප ව්‍යාප්ත නිර්මාණ තරගාවලිය හා සමාජ කථිකා විශිෂ්ඨතා සම්මාන තරගාවලිය පැවැත්විය හැකි විය.

අපේක්ෂිත ඉලක්කයන් ලඟාකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සෑම අංශයකම නිලධාරීන් කටයුතු කළ අතර ඒ සම්බන්ධව මාගේ ප්‍රශංසාව පුද කරමි. එසේම කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට හා ජාත්‍යන්තර කම්කරු සංවිධාන කොළඹ කාර්යාලයේ දායකත්වයද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

එම්.ඩී. චාන්දනී අමරතුංග
කම්කරු කොමසාරිස් ජනරාල්
*කම්කරු දෙපාර්තමේන්තුව*

# 01. කම්කරු දෙපාර්තමේන්තුව

සමස්ත ශ්‍රී ලාංකේය කම්කරු පන්තියේ බහුතරයක් නියෝජනය කරනු ලබන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව පාදක කර ගනිමින් ඔවුන්ගේ සුබසාධනය මෙන්ම සේවා සේවක සබඳතාවයන් සුරක්ෂිත කරමින් වඩාත් ප්‍රශස්ථ මට්ටමකින් සිය ආයතනික ඵලදායිතාවය නංවාලීමට කටයුතු කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව වර්තමානය වන විට ඉහත අරමුණු සාධනය කරගැනීමෙහිලා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයක් බවට පත්ව ඇත.

මෙවන් වඩාත් ඵලදායී ක්‍රියාවලියක නිරතව සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ ඉතිහාසය පිළිබඳව විමර්ශනය කරන විට ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්ව තිබූ (ක්‍රි.ව. 1815 - ක්‍රි.ව. 1948) යුගයේ මුල් අවධියේදී ව්‍යාපාරික වතු වගාවට පාලකයන් විසින් පිරිනමන ලද සිත්ගන්නාසුළු විවිධ අනුග්‍රහයන් හේතුකොටගෙන තේ හා කෝපි වගාව ව්‍යාප්ත කිරීමට බ්‍රිතාන්‍ය ව්‍යාපාරිකයන් සිය මුදල් ආයෝජනය කරන්නට උත්සුක වූ අතර සිය භූමිය බලහත්කාරයෙන් අත්පත් කරගනිමින් විවිධ දණ්ඩනයන්ට යටත් කර ගනිමින් ඇඟ බද්ද වැනි විවිධ බදු වර්ග පනවමින් බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ අණසක පතුරුවමින් සිදු කරනු ලැබූ මෙම නව කර්මාන්තයට ශ්‍රමය සැපයීම ස්වදේශිකයන් වූ සිංහල ජනතාව විසින් නිබඳවම ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන්, අත්‍යාවශ්‍ය නිෂ්පාදන සාධකයක් ලෙස සලකනු ලබන ශ්‍රම සම්පතේ උග්‍ර හිඟයකට මුහුණ පෑ ශ්‍රී ලංකාවේ වතු වගාවට ප්‍රවිශ්ඨ වූ බ්‍රිතාන්‍ය ව්‍යාපාරිකයන් මෙන්ම බ්‍රිතාන්‍ය පාලකයන්ද ඉමහත් ගැටළුකාරී වාතාවරණයකට මුහුණ පැහ. මීට විසඳුම් ලෙස වර්ෂ 1824දී ඉතා අඩු වැටුපකට දකුණු ඉන්දීය ද්‍රවිඩ කම්කරුවන් මෙරටට ගෙන්වා අවම පහසුකම් යටතේ ඔවුන්ගේ ශ්‍රමය ලබාගන්නා ලදී.

කල්ගතවීමේදී ඉන්දියාවෙන් ගෙන්වූ දකුණු ඉන්දීය ද්‍රවිඩ කම්කරුවන්ගෙන් ඇති වූ ජනගහනය කෙමෙන් විශාල වීමෙන්, වර්ෂ 1921 පැවැත්වූ ජනසංගනනයට අනුව දකුණු ඉන්දියානු සම්භවයක් ඇති කම්කරු ප්‍රජාව සංඛ්‍යාත්මකව 602,700 ක් වැනි ඉහළ අගයක් දැක්වූ අතර අවම පහසුකම් යටතේ අඩු වැටුපකට සේවය කළ ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉතා පහළ තත්ත්වයක පැවති අතර ඔවුනට සුභසාධනය සැපයීමේ අදිටනින් වර්ෂ 1923 අංක 1 දරණ "ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනත" එවකට ශ්‍රී ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ක්‍රියාත්මක කිරීම අරඹන ලදී. එමෙන්ම මෙම පනත ක්‍රියාත්මක කිරීමට සුදුසු යාන්ත්‍රණයක් ලෙස ඉන්දීය ආගාමික කම්කරු පාලක වරයාගේ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබූ අතර කල්ගත වීමේදී කෙමෙන් ශ්‍රී ලාංකික අනන්‍යතාවයකින් හෙබි කම්කරු පන්තියක්ද බිහිවූ අතර එම සේවක ප්‍රජාව මුහුණපාන ලද විවිධාකාර සේවා ගැටළු පිළිබඳ විසඳුම් ඉල්ලා පාලක පන්තිය වෙත ඉල්ලීම් යොමු වූ අතර එම ගැටළු විසඳා ඊට පිළියම් ලබා දීම ද "ඉන්දීය ආගාමික කම්කරු පාලක වරයාගේ කාර්යාලය" ට පවරාදීමෙන් පසු කම්කරු දෙපාර්තමේන්තුව ජාතික වශයෙන් ක්‍රියාත්මක වීම ඇරඹුනු බවට පිළිගත් සාක්ෂි පවතී. ඒ අනුව, 1931 වර්ෂයේ ජූලි මාසයේදී පිහිටුවන ලද කම්කරු දෙපාර්තමේන්තුව කම්කරු පාලකවරයෙකු යටතේ පවතින ලදී. 1945 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී කම්කරු පාලක යන තනතුරු නාමය ´කම්කරු කොමසාරිස්´ යනුවෙන් නම් කරනලද අතර 1994 වර්ෂයේදී වඩාත් බලතල සහිත කම්කරු කොමසාරිස් ජනරාල් තනතුර ඇති කරන ලදී. වර්තමානයේදී කම්කරු දෙපාර්තමේන්තුව කම්කරු කොමසාරිස් ජනරාල් යටතේ, කම්කරු ක්ෂේත්‍රය පාදක කොටගනිමින් ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකය විසින් වසර 92 ක් තුළ සම්මත කර ගැනීමෙන් නීතියෙන් බලගැන්වූ අණපනත් 63ක සංඛ්‍යාවක් ක්‍රියාවෙහි යෙදවීමේ සුවිසල් කාර්යයෙහි යෙදී සිටී. එසේම, 1948 වර්ෂයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් අනතුරුව කම්කරු ආරක්ෂණයට සහ සුබ සාධනයට අදාලවන ප්‍රඥප්ති 41ක් ක්‍රියාත්මක කිරීම සඳහාද කම්කරු දෙපාර්තමේන්තුව බැඳී සිටී.

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ප්‍රසාරණය වීමෙන් අනතුරුව ඒ තුළ පෞද්ගලික අංශයද පුළුල් අයුරින් ප්‍රසාරණයට ලක් වූ අතර එවන් පුළුල් ක්ෂේත්‍රයක රැකියා නියුක්තිගත සුවිශාල සේවක ප්‍රජාවක් අරබයා, ඔවුනට අවශ්‍ය වන්නා වූ සුභසාධන පහසුකම් සැලසීමේ අදිටනින් මෙන්ම, සේව්‍ය පක්ෂයට කම්කරු අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් කම්කරුවන්ගේ සේවය ලබාගැනීමට අවශ්‍ය නීතිමය අණපනත් පිළිබඳව දැනුවත් කරමින්, සේව්‍ය සේවක දෙපක්ෂය අතර මනා සබඳතාවයක් බිහිකිරීමට ප්‍රයත්න දරමින් ආයතනික ඵලදායිතාවය ඉහළ නැංවීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව වර්තමානයේදී සුවිසල් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට පැවරී ඇති සුවිශාල වූ, අත්‍යාවශ්‍ය වූ කාර්යභාරය ඉටුකිරීමට නිබඳවම සූදානමින් පසුවන කම්කරු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය වර්ෂ 2015.12.31 දිනට 2,403 ක් විය.

දිවයින පුරා විසිරී සිටින 7,000,000 ක් පමණ වන ශ්‍රම බලකායෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය ලැබිය යුතුයැයි උපකල්පිත පිරිසකගේ අනේකවිධ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය බහුවිධ සේවාවන් සලසමින් යහපත් හා වඩාත් සංවිධිත සාමකාමී කාර්මික පරිසරයක් සිය කාර්යභාරය ලෙස සලකා කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව අත්‍යාවශ්‍ය අංශ 13 ක් ක්‍රියාත්මකව පවතින අතර, දිවයින පුරා විසිරී සිටින කම්කරු ප්‍රජාවගේ අපේක්ෂිත සේවා පහසුකම් සපුරා ගැනීමට නීතිමය රැකවරණයත්, සුභසාධනයත් සැලසීමේ අදිටනින් කලාප කම්කරු කාර්යාල 11 ක්ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක්ද, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක්ද කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ, දිවයින පුරා පිහිටුවා ඇත.

## දෙපාර්තමේන්තුවේ දැක්ම

ජාත්‍යන්තර තරඟකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක්.

## දෙපාර්තමේන්තුවේ මෙහෙවර

කාර්මික සාමය තහවුරු වූ යහපත් වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

## දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

- කම්කරු සුභසාධනය හා ප්‍රවර්ධනය උදෙසා සුසැදි අණපනත් ක්‍රියාවට නැංවීම සහ කාර්මික ආරවුල් සමථයකට පත් කිරීම
- කම්කරු ප්‍රජාව පාදක කරගත් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව සමීක්ෂණ පැවැත්වීම, කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට හා කම්කරු ප්‍රජාවගේ අභිවෘද්ධියට පාදක වන ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් සකස් කිරීම, බාහිර හා අභ්‍යන්තර දැනුවත් කිරීමේ හා අධ්‍යාපනය ලබාදීමේ කටයුතු සිදු කිරීම
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් අතර සමාජ කතිකාවත ප්‍රවර්ධනය කිරීම
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යාලේඛන රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඉදිරිපත් කිරීම
- වෘත්තීය සමිති සමග සබඳතා යහපත්ව හා සජීවී අයුරින් පවත්වාගෙන යාම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයා වශයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සමග සහයෝගයෙන් හා සජීවී ආකාරයෙන් කටයුතු කිරීම

## සංවිධිත කාර්මික සාමයක් උදෙසා දරන ලද ප්‍රයත්න

රාජ්‍ය ව්‍යවසායකත්වයට වඩා පෞද්ගලික අංශයේ ව්‍යවසායකත්වය කෙරෙහි වඩාත් වැඩි අවධානයක් යොමුව ඇති ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලබන වත්මන් රජයේ ආර්ථික ප්‍රතිපත්තියට අනුව පෞද්ගලික අංශයේ ගාමක බලවේගය ලෙස සැලකෙන පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාවටද වැදගත්කමක් ආරෝපණය වී ඇත. ඒ ඔවුන්ගේ ඵලදායී සේවය පෞද්ගලික අංශයේ ඵලදායිතාවයට ඒ තුළින් ආර්ථික අභිවර්ධනයටත් හේතුසාධක වන බැවිනි.

මෙම තත්ත්වය මත පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාවට අතීතයේ පැවතියාට වඩා වැඩි වර්ධනය වූ වටිනාකමක් ආරෝපණය වීම නොවැළැක්වියහැකි කරුණක් වනු ඇත. මේ අනුව පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාවගේ ඵලදායිතාවය අභිවර්ධනය කිරීමෙන් අපේක්ෂිත ආර්ථික අරමුණු ජයගැනීමට පවතින හැකියාව මෙහිදී වඩාත් අවධාරණයට ලක්වීමට නියමිතය. එවන් වාතාවරණයක් හමුවේ පෞද්ගලික අංශය සවිමත් කිරීම උදෙසා පවතින එකම රාජ්‍ය දෙපාර්තමේන්තුව ලෙස හැඳින්විය හැකි කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තවතවත් පෘථුල වී ඇත.

එම අදහස පෙරදැරිව කටයුතු කිරීමේදී, යහපත් කාර්මික සාමයක් ස්ථාපිතව පැවතීම ආයතනික අරමුණු හා ඉලක්ක ජයගැනීමට මෙන්ම සමස්තයක් ලෙස ගත් කල රට පුරා යහපත් කාර්මික සාමයක් පැවතීමත්, අපේක්ෂිත ආර්ථික අරමුණු ජයගැනීමටත්, අවසානයේ තිරසාර සංවර්ධනයක ජයග්‍රහණ හිමිකරගැනීමටත් සමස්ත ශ්‍රී ලංකාවාසීන්ට ම අවස්ථාව උදාවනු ඇත.

මේ අනුව විමසා බලන විට යහපත් කාර්මික සාමයක් රට තුළ ස්ථාපිතව පැවතීම රටකට අවශ්‍ය අත්‍යාවශ්‍ය අංගයක් ලෙස දැක්විය හැක.


කර්මාන්තශාලා තුළ මෙන්ම වැඩබිම් තුළ හා සේවා සපයන ආයතනයන්හි සේවයේ නියැලි සේවක පිරිස මෙන්ම එම කර්මාන්තශාලා, වැඩබිම් හා සේවා සපයන ආයතන පාලනය කරනු ලබන හා ඒවා මෙහෙයවන සේව්‍ය පක්ෂය මනා සහයෝගයෙන් මෙන්ම අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමෙන් සේව්‍ය සේවක ආරවුල් අවම තත්ත්වයකට පත්වී, එම ආරවුල් දුරදිග යාමෙන් වැළකී වැඩවර්ජන අවස්ථාවන් කරා නොපැමිණ වඩාත් සාමකාමී අයුරින් සේවා ස්ථානවල දෛනික කාර්යයන් පවත්වාගෙන යාම මගින් ඇති කරගනු ලබන කාර්මික සාමය රැඳි වාතාවරණය පළමුවෙන්ම ආයතනික අභිවෘද්ධිය කෙරෙහිද, අවසාන වශයෙන් ශ්‍රීලංකාද්වීපයේ අපේක්ෂිත සංවර්ධන තත්ත්වයන් ළඟා කර ගැනීමට පාදක වන ඉලක්කයන් සපුරාගැනීමේ ප්‍රමුඛතම හේතු සාධකය ලෙස දැක්විය හැක.


ජාතික වශයෙන් වැදගත්කමක් උසුලන මෙවන් භාරධූර කර්තව්‍යයක් ඉටු කිරීමට, එනම් සේව්‍ය සේවක දෙපක්ෂය අතර මනා සබැඳියාවක් ඇතිකරලීමට අවශ්‍ය පිළිගත් නීතිමය ශක්තියක් ඇති බලගතු රාජ්‍ය ආයතනය ලෙස කම්කරු දෙපාර්තමේන්තුව හැඳින්විය හැකි අතර එම සද්කාර්යයට දායක වූ කම්කරු දෙපාර්තමේන්තුව සිය සාධනීය මෙහෙවර ඉටුකිරීමෙහිලා එය සතු විවිධ අංශ මගින් 2015 වර්ෂයේදී දිවයින පුරා ඉටුකරන ලද මාහැඟි මෙහෙවරට අදාළ වන සියළු තොරතුරු හා කාර්යභාරය මතු දක්වා ඇත.

## 02. කම්කරු පරීක්ෂණ

කිසියම් රටක අපේක්ෂිත සංවර්ධන තත්ත්වයන් ළඟාකර ගැනීමෙහිලා එම රට තුළ තෘප්තිමත් භාවයට පත් ශ්‍රම බලකායක් පැවතීම අත්‍යවශ්‍ය වන්නකි. එම විශ්වාසය පෙරදැරිව සමස්ථ දිවයින තුළම යහපත් කාර්මික සාමයක් පවත්වාගෙන යාමට කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දිවයින පුරා සිදුකරනු ලබන කම්කරු පරීක්ෂණ මගින් රටේ සමස්ථ ඵලදායිතාවය ඉහළ නැංවීමට හේතුවන බව ප්‍රත්‍යක්ෂ වී ඇත. එමෙන්ම කම්කරු පරීක්ෂණ නොපැවැත්වීමෙන් කාර්මික ආරවුල් වර්ධනය වී නිරන්තරයෙන් වැඩවර්ජන තත්ත්වයන් ඇති වී කාර්මික සාමය පළුදු වී, ඵලදායිතාවය අවම මට්ටමකට පැමිණෙන බවට සාක්ෂි පවතී.

**පසුගිය පස් වසර තුළ පැවැත්වූ කම්කරු පරීක්ෂණ හා වාර්තා වූ කාර්මික ආරවුල් සංඛ්‍යාව**




කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් 2015 වර්ෂයේදීද කම්කරු ආරවුල් ප්‍රමාණය මෙලෙස අවම වීමට බලපා ඇති අතර, ඒ පිළිබඳව විමර්ශනය කිරීමේදී දෘශ්‍යමාන හේතු ලෙසට කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ඉහළ නැංවීමත්, ශක්තිමත් කිරීමත් කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ජනමාධ්‍ය ඉවහල් කර ගනිමින් කරනු ලැබූ විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් වීමත් යනාදී කරුණු බලපා ඇති බව පෙනී යයි.

කලාපීය මට්ටමින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම වඩාත් සංවිධිත ආකාරයෙන් පැවැත්වීමෙන්, කම්කරු නිලධාරීන් විසින් සිදුකරනු ලබන කම්කරු පරීක්ෂණ පිළිබඳව වඩාත් වැඩි අවධානයක් යොමු කරනු ලබන අතර එමගින් කම්කරු නිලධාරීන් විසින් සිදුකරනු ලබන දුර්වලතා, අඩුපාඩු හොඳින් වටහාගෙන එම තත්ත්වය අවම කර ගැනීමට අවශ්‍ය මගපෙන්වීම සිදුකරනු ලබන අතර ඉහත අරමුණු ජයගැනීමෙහිලා 2015 වර්ෂයේදී දිවයින පුරා පැවැත්වූ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව 5 ක් ලෙස දැක්විය හැක.

**යහපත් කාර්මික සාමයක් උදෙසා සමාජ කතිකා අංශයේ දායකත්වය**

සේව්‍ය සේවක දෙපක්ෂය අතර මනා සබැඳියාවක් අන්‍යෝන්‍ය විශ්වාසයක් ගොඩනැගීම පිණිස තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩාත් විනිවිද භාවයක් සහිතව පවත්වාගෙන යාමටත් ඔවුනොවුන් අතර යහපත් කතිකාවතක් වර්ධනය කිරීමත්, එමගින් සහයෝගිතාව වර්ධනය කිරීමත්, වසර අවසානයේ එම යෝජිත ක්‍රමවේදයන්ට අනුකූලව සිය ආයතනික ඵලදායකත්වය වර්ධනය කරගත් ආයතන විධිමත් ක්‍රියාපටිපාටියකට අනුව ඇගයීමත්, තිළිණ ප්‍රදානයත් මෙම අංශයේ ප්‍රමුඛතම කාර්යභාරය ලෙස

හැඳින්විය හැක. කතිකාව හා සහයෝගිතාව ප්‍රවර්ධනය පිණිස දිස්ත්‍රික් හා කලාප මට්ටමින් ක්‍රියාකාරී උපදේශන කමිටු පිහිටුවීමත් එමගින් ත්‍රෛපාර්ශ්වීය ක්‍රමවේදය තුළ තීරණ ගැනීම සඳහා අවස්ථාව උදා කිරීම තුළින් යහපත් වැඩ පරිසරයක් ගොඩනැංවීමට පියවර ගැනීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

**2015 වර්ෂයේදී සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ඒකකය පවත්වනු ලැබූ වැඩසයහන් වල ප්‍රගතිය**

| | | |
|---|---|---|
| සමාජ කතිකා අංශය මගින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 80 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 4,403 |
| කලාප, දිස්ත්‍රික් හා උප කාර්යාල මගින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 116 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 4,094 |

දීප ව්‍යාප්ත සමාජ කතිකා විශිෂ්ටතා වැඩසටහන් වලට අමතරව සමාජ කතිකා අංශය මගින් වාර්ෂිකව පවත්වනු ලබන ඵලදායිතා සම්මාන උළෙල මෙවර ද අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධනත්වයෙන් 2015.12.17 දින නෙළුම් පොකුණ රඟහලේ දී ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී අභිමානවත් අයුරින් පවත්වන ලද අතර එහිදී මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා සුළු පරිමාණ වශයෙන් වතු, සේවා, ඇඟළුම්, නිෂ්පාදන යනාදී අංශ 4 ක් වෙනුවෙන් ජයග්‍රාහකයන් තෝරා ඔවුනට සම්මාන හා සහතික පත්‍ර පිරිනැමූ අතර සමස්ථ ශ්‍රී ලාංකික සේවක ප්‍රජාවගේ කුසලතා එළිදැක්වීමේ අදහසින් යුතුව පවත්වන ලද චිත්‍ර, ගද්‍ය රචනා (සිංහල/දෙමළ), පද්‍ය රචනා (සිංහල/දෙමළ), පෝස්ටර්, කෙටි වීඩියෝ, චිත්‍රපට යනාදී අංශ 7 ක් සඳහා තරඟ පවත්වා ජයග්‍රාහිකයන්ට ත්‍යාග හා සහතික ප්‍රදානය කිරීමද සිදු කරන ලදී.

**2015 වර්ෂයේ වැඩ වර්ජන**

අර්ධ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව විසින් 2015 වර්ෂයේදී සිදු කරන ලද වැඩවර්ජන සංඛ්‍යාව ලෙස 36 ක් වාර්තා වී ඇත. එම වැඩවර්ජන උදෙසා සහභාගි වූ සේවක සංඛ්‍යාව 8,400 ක් වන අතර, එම වැඩ වර්ජන හේතු කොටගෙන අහිමි වූ මිනිස් දින ගණන 38,373 ක් ලෙස සටහන් වේ.

**2015 වර්ෂයේ නීතී ක්‍රියා අංශයේ කාර්යභාරය**

කම්කරු දෙපාර්තමේන්තුවේ නෛතික කටයුතු මෙහෙයවීම මෙම අංශයේ කාර්යභාරය ලෙස දැක්විය හැක. දෙපාර්තමේන්තුව හා සම්බන්ධ නෛතික කටයුතු වලදී කම්කරු කොමසාරිස් ජනරාල්

නියෝජනය කරමින් ඒ හා සම්බන්ධ අධිකරණ කටයුතු වලදී නීතිපතිට සහය වීමද නීති ක්‍රියා අංශය මගින් ඉටුකරනු ලබන ඉතා වැදගත් කාර්යභාරයක් ලෙස හැදින්විය හැක.

ස්වේච්ඡාවෙන් අනුගමනය කිරීම උදෙසා සේව්‍යයන් පිළිබඳවත් සේවකයන් හා සම්බන්ධ අවම නෛතික ප්‍රතිපාදනයන් තහවුරු කිරීම පිණිස නීති ක්‍රියා අංශය සිය නිරන්තර අවධානය යොමු කරනු ලබයි.

2015 වර්ෂයේදී නීති ක්‍රියා අංශය ගොනු කළ නඩු සංඛ්‍යාව පසුගිය 2014 වර්ෂයට වඩා ක්ෂේත්‍ර ගණනාවකින් වර්ධනයක් දැක්වෙන අතර එය පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පැවරූ නඩු සංඛ්‍යාවෙන් දෘශ්‍යමාන වේ.

**පැවරූ නඩු සංඛ්‍යාව**

| පනත | 2014 | 2015 |
|---|---|---|
| පාරිතෝෂිත ගෙවීම් පනත | 2,044 | 2,524 |
| කාර්මික ආරවුල් පනත | 146 | 153 |
| සේවය අවසන් කිරීමේ පනත | 36 | 49 |
| පඩිපාලක සභා ආඥා පනත | 244 | 282 |
| සාප්පු හා කාර්යාල සේවක පනත | 88 | 99 |
| ප්‍රසූතිකාධාර පනත | 03 | 03 |
| ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පිළිබඳ පනත | 11 | 05 |
| සේවක අර්ථසාධක අරමුදල් පනත | 3,244 | 2,336 |
| කම්කරු විනිශ්වය සහා නියෝග | 183 | 164 |
| අයවැය සහන දීමනා පනත | 32 | 29 |
| අනුමත අර්ථසාධක අරමුදල් | 07 | 03 |

**විශේෂ විමර්ශන අංශයේ කාර්යභාරය**

කාර්මික සාමය බිඳවැටෙන විට මැදිහත් වීම මෙන්ම යම් යම් සුවිශේෂී කර්මාන්ත හා සේවා පිළිබඳව කාලීනව පැවරෙන ව්‍යාපෘති සඳහා මැදිහත්වීම විශේෂ විමර්ශන අංශය මගින් සිදු වේ. පැමිණිලි පරීක්ෂණ හා ආයතන විමර්ශන කටයුතු සඳහා කලාප කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාල ජාලයක් දීප ව්‍යාප්තව පවතින අතර පහත සඳහන් අවස්ථා වලදී මෙම අංශය ඒ සඳහා මැදිහත් වේ.

I. කම්කරු අණපනත් හා විධිවිධාන ක්‍රියාවට නැංවීම සඳහා හදිසි පරීක්ෂණ හා විශේෂ විමර්ශන රාජකාරි කටයුතු වල යෙදීම.
II. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය, කම්කරු කොමසාරිස් ජනරාල්, අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් විසින් යොමු කරන මහජන පැමිණිලි පිළිබඳ කඩිනමින් අවශ්‍ය පියවර ගැනීම.
III. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව වැනි ආයතන විසින් මහජන පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන විමසීම් සඳහා පිළිතුරු යොමු කිරීම.

IV. දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ සමඟ එක්ව ඒකාබද්ධ විමර්ශන කටයුතු ක්‍රියාවට නැංවීම.

V. මහජන පැමිණිලි පිළිබඳව දිස්ත්‍රික්, උප කම්කරු හා කලාප කාර්යාල මගින් වාර්තා කැඳවීම.

VI. ව්‍යවස්ථාපිත ගණනය කිරීම් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීම.

**2015.12.31 දිනට විශේෂ විමර්ශන අංශයේ ප්‍රගතිය**

| | |
|---|---|
| ලද පැමිණිලි සංඛ්‍යාව | 292 |
| ගණනය කරන ලද සේවක අර්ථසාධක හිඟ මුදල් රුපියල් (000) | 634,968,795 |
| ගණනය කරන ලද ව්‍යවස්ථාපිත දීමනා හිඟ මුදල් රුපියල් (000) | 4,995,760 |

## 03. වැටුප් සේවා කොන්දේසි මගින් සේවක ප්‍රජාවට සුරක්ෂිතතාවය

**සේවක සුරක්ෂිත භාවය උදෙසා වැටුප් සේවා කොන්දේසි**

පෞද්ගලික අංශයේ සේවයේ නියුක්තව සිටින සේවා නියුක්තිකයන්ගේ ජීවන තත්ත්වය වඩාත් සුරක්ෂිත කිරීම උදෙසා ඔවුන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ අනාගතය වඩාත් යහපත් කිරීමේ ප්‍රාර්ථනයෙන් එම සේවක පිරිස වැය කරනු ලබන ශ්‍රමය උදෙසා ඊට අනුගත වන වැටුපක් ලබාදීමේ අදිටනින් දෙපාර්ශවයටම පිළිගත හැකි සේවා කොන්දේසි පැනවීමෙන් ශ්‍රම සූරාකෑමට ඉඩ අහුරමින් සේව්‍ය සේවක දෙපාර්ශවය අතර යහපත් සබඳතාවයක් වර්ධනය කිරීමේ අදහසද පෙරදැරිව ක්‍රියාත්මක වන මෙම අංශයේ වැඩකටයුතු වල අවසාන ඉලක්කය වන්නේ යහපත් කාර්මික සාමයක් රට තුළ ස්ථාපිත කර ශ්‍රී ලංකා ද්වීපයේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීමට ක්‍රියාකිරීමයි. මෙවන් භාරධූර ක්‍රියාවලියක් මෙහෙයවන ශ්‍රම ප්‍රමිති අංශය වූකලී කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින සක්‍රීය අංශයක් ලෙස හඳුන්වා දිය හැක. මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන අණපනත් වන්නේ,

I. 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥා පනත
II. 1954 අංක 19 දරණ කාර්යාල සේවකයන් පිළිබඳ සේවය හා වේතන විධිමත් කිරීමේ පනත
III. 2005 අංක 36 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත

**ශ්‍රම ප්‍රමිති අංශයේ කාර්යභාරය**

I. 2014 වර්ෂයේ පත් කිරීමට නියමිතව පැවති පඩිපාලක සභා 16 ක නියෝජිතයන් පත්කිරිම.
II. 2015 වර්ෂය තුළ සිදු කිරීමට යෝජිත වූ වැටුප් වැඩි කිරීම් වලට අදාළ පඩිපාලක සභා තීරණයන් පිළිබඳ විරෝධතා කැඳවිම.
III. 2015 වර්ෂය තුළ පුරප්පාඩු වූ පඩිපාලක සභා නියෝජිතයන් පත් කිරීම.
IV. 2015 වර්ෂයේදී පඩිපාලක සභා රැස්වීම් 48 ක් පැවැත්වීම.
V. රබර් වැවීම හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභා ආඥාව ප්‍රසිද්ධියට පත්කිරීම සහ එම කර්මාන්තයට අදාළ සේවා කොන්දේසි සකස් කිරීම.
VI. කොකෝවා, කරදමුංගු, ගම්මිරිස් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයේ වැටුප් විස්තර මාසිකව පළකිරීම.
VII. නැව් තටාක තොටුපොළවල් හා වරායන්හි ප්‍රවාහන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ ආඥාව සැකසීම.
VIII. පඩිපාලක සභා නියෝජිතයන්ගේ පැමිණීමේ දීමනා වැඩි කිරීමට අදාළ නියෝග නම්කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

# 04. සමාජ ආරක්ෂණය උදෙසා ක්‍රියාත්මක වැඩසටහන්


**සේවක අර්ථසාධක අරමුදල**

සේවක අර්ථසාධක අරමුදල යනු මෙරට පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදී සිටින සෑම සේවකයෙකුටම විශ්‍රාම දිවිය යහපත් අයුරින් ගත කිරීමට අත්වැලක් වීමේ අදිටනින් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 1958 ජුනි 01 දින සිට ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රමුඛතම සමාජ ආරක්ෂණ ක්‍රමය ලෙස හඳුන්වා දිය හැක.

සේවක අර්ථසාධක අරමුදල් පනත ක්‍රියාත්මක වූ 1958 ජුනි 01 දින සිට එම පනතේ සඳහන් විධිවිධාන අනුව මෙම අරමුදලට අදාල පරිපාලන කටයුතු කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ද අරමුදලට අදාල මූල්‍ය පාලන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ද පාලනය කරනු ලබයි.

අදාළ සේවකයාගේ මාසික වැටුපෙන් 8% ක ප්‍රතිශතයක්ද සේව්‍යයාගෙන් 12% ක ප්‍රතිශතයක්ද එකතු කර සේවකයාගේ නමින් මාසිකව බැංකුගත කිරීමෙන් සේවකයාගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂය වර්ධනය වන අතර ඇතැම් සේවාස්ථානයන්හි සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සේවකයාගේ මාසික වැටුපෙන් 10% සහ සේව්‍යාගෙන් 15% ක් වන අවස්ථාද පවතී.

**පසුගිය පස්වසර තුළ දායක මුදල් රැස්කිරීමේ ප්‍රගතිය**




2015.12.31 දිනට අරමුදලේ වටිනාකම රුපියල් මිලියන 1,664,852ක් වූ අතර වර්ෂය තුළ එක්වරක් හෝ දායක මුදල් ගෙවන ලද සාමාජික සංඛ්‍යාව මිලියන 2.4 කි. වර්ෂය තුළ එක්වරක් හෝ සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවන ලද සේව්‍යයන් සංඛ්‍යාව 72,917කි.


**සේවක අර්ථසාධක අරමුදල මගින් 2015 වර්ෂයේ ඉටුකළ කාර්යභාරය**


සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ තොරතුරු පද්ධතිය වර්තමානය වන විට සියලුම දිස්ත්‍රික් කම්කරු කාර්යාල වල හා උප කම්කරු කාර්යාල වල ස්ථාපනය කර ඇත. මෙලෙස සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ දත්ත පද්ධතිය ස්ථාපිත කරන ලද දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල විසින් සේවායෝජක ආයතන වලට අදාලව හිඟ මුදල් ගණනය කිරීම සහ නිවේදන යොමු කිරීම මෙන්ම සේවක අර්ථසාධක හිඟ මුදල් අයකිරීමට අදාල කටයුතු සිදු කරනු ලැබීය. මෙම දත්ත පද්ධතිය ස්ථාපනය කිරීමෙන් පසු සේවක අර්ථසාධක අරමුදලේ කටයුතුවල ප්‍රගතියක් දෘශ්‍යමාන වේ.

සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් තොරතුරු පද්ධතිය වර්තමානය වන විට සියලුම දිස්ත්‍රික් කම්කරු කාර්යාල වල ස්ථාපනය කර ඇති අතර, උප කම්කරු කාර්යාල අතරෙන් නාවලපිටිය, බෙලිඅත්ත, මන්නාරම, මහියංගනය හා මොරවක කාර්යාලවලද ස්ථාපිත කර ඇත.

මුළු දිවයිනහිම පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2015 වර්ෂයේදී සාමාජිකයන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් 127,107 ක් සඳහා ගෙවීම් නියෝග නිකුත් කර රුපියල් මිලියන 77,769 ක් ප්‍රතිලාභ ලෙස ගෙවා ඇත.

**2015 වර්ෂයේදී ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ගෙවූ ප්‍රතිලාභ මුදල් පහත දැක්වේ.**




ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය හා අර්ධ රාජ්‍ය අංශය නියෝජනය කරනු ලබන සමස්ථ සේවක ප්‍රජාවට සිය සමාජ ආරක්ෂණය උදෙසා භාරධූර කාර්යයක් ඉටු කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල් අංශය වූ කලී කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින ප්‍රමුඛතම අංශයක් ලෙස අවිවාදයෙන් හඳුන්වා දිය හැක.

එපමණක් නොව 2015 වර්ෂයේ සිට ආරම්භ කරන ලද සේවක අර්ථසාධක අරමුදල සඳහා වසර 10 ක් හෝ 10 කට වැඩි සේවාකාලයක් ඇති, සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය රුපියල් ලක්ෂ

03ට වැඩි හා දැනට සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ලැබෙන සාමාජිකයන් හට නිවාස සහ සෞඛ්‍ය අරමුණින් සාමාජික ශේෂයෙන් 30% ක පූර්ව ප්‍රතිලාභ ලබා දීමේ ව්‍යාපෘතිය ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබේ.

**2015.12.31 දිනට 30% යෝජනා ක්‍රමයේ ප්‍රගතිය**

| | මෙතෙක් ලැබී ඇති අයදුම්පත් ගණන | යවනු ලැබූ S අයදුම්පත් ගණන | භාරදුන් S අයදුම්පත් ගණන | යැවූ මුත් මෙතෙක් භාර නොදුන් S අයදුම්පත් ගණන | වැඩ කරමින් පවතින S අයදුම්පත් ගණන | තීරණ ලිපි ගණන | අත ඉතිරි ගණන |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 70,839 | 46,594 | 12,873 | 33,721 | 3,352 | 9,521 | 24,245 |
| විමධ්‍යගත කරන ලද අනෙකුත් කාර්යාල | - | - | 912 | - | - | 404 | - |

## 05.කාන්තා හා ළමා කටයුතු උදෙසා දැක්වූ දායකත්වය

**කාන්තාවන් හා ළමයින් පාදක කරගත් වැඩසටහන්**

ශ්‍රී ලාංකේය ශ්‍රම බලකායේ සැලකිය යුතු ප්‍රතිශතයක් නියෝජනය කරනු ලබන කාන්තා සේවා නියුක්තිකයන් සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලියට විශේෂ දායකත්වයක් දක්වන බව විදේශ විනිමය ඉපැයීම් වලින් මුල්තැන ගන්නා අංශ අතර කාන්තා ශ්‍රම දායකත්වයෙන් කරන ලබන ඇඟලුම් වැනි නිෂ්පාදන වලින් සනාථ වේ. එවන් මෙහෙයක් ඉටු කරනු ලබන වැඩකරන කාන්තාවන්ගේ වෘත්තිය අයිතිවාසිකම් හා ආරක්ෂාව මෙන්ම කාන්තාවකට ඇයගේ සෞඛ්‍යය මෙන්ම සුබසාධනය සම්බන්ධ පහසුකම් හා වරප්‍රසාද සැලසීමේ අරමුණෙන් යුතුව අණපනත් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි.

එසේම බාලවයස්කාර දරුවන් ගෘහ සේවයේ හා වෙනත් අවදානම් සහගත සේවාවන්හි යෙදවීමේ ගැටළුවට පිළියම් ලෙස ළමා ශ්‍රමය වැළැක්වීමේ මූලික අරමුණින් යුතුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල සමග ඒකාබද්ධව පරීක්ෂණ කටයතු සිදු කරනු ලැබේ.

මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අණපනත් පහත සඳහන් කර ඇත.

I. 1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත
II. 1939 අංක 32 දරණ ප්‍රසූතිකාධාර ආඥා පනත
III. 1954 අංක 19 දරණ සාප්පු කාර්යාල සේවක පනතේ ස්ත්‍රීන් හා තරුණ අයට අදාළ 2 සහ18 කොටස්
IV. 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනතේ ස්ත්‍රීන් හා තරුණ අයට අදාළ කොටස්

එමෙන්ම 2015 වර්ෂයේ කාන්තාවන් හා ළමුන් අරබයා පැවති විශේෂිත ක්‍රියාකාරකම් වලට කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය මගින් දැක්වූ දායකත්වය පහත සඳහන් කර ඇත.

### 1. ජාත්‍යන්තර කාන්තා දිනය 2015.03.08

කටුනායක, බියගම, කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයන්ට අයත් ආදර්ශ නේවාසිකාගාර වල නේවාසිකයන් අතරින් ගායනා කුසලතා දක්වන නේවාසිකාවන් පස් දෙනෙකු බැගින් තෝරා ජාත්‍යන්තර කාන්තා දිනයේ කම්කරු දෙපාර්තමේන්තුවේ පැවැත්වූ වැඩසටහනේදී ජයග්‍රාහිකාවන් තෝරා ත්‍යාග හා සහතික පත්‍ර පිරිනමන ලදී.

### 2. ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය

2015.06.12 දිනට යෙදුන ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ ශ්‍රවනාගාරයේ පැවති සැමරුම් උළෙලේදී ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් සමරු මුද්දරයක් නිකුත් කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක 22 ක් (රත්නපුර, කෑගල්ල, අම්පාර හැර) ළමා ශ්‍රමයෙන් තොර කලාපයක් බවට පත්කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන අරඹන ලදී.

**3. ලෝක ළමා දිනය සැමරීම**

2015.10.01 දිනට යෙදුනු ලෝක ළමා දිනයට සමගාමීව 2016 දී ළමා ශ්‍රමයෙන් තොර (ශූන්‍යත්වයට පත් කරන ලද ළමා ශ්‍රමය) ශ්‍රී ලංකාවක් බවට පත්කිරීමේ වැඩසටහන පිළිබඳව ඌව, උතුර හා බස්නාහිර පළාත් වල පා ගමන් තුනක් පවත්වන ලදී.

**4. අනතුරුදායක ළමා ශ්‍රමය වැළැක්වීම**

අනතුරුදායක ළමා ශ්‍රමය වැළැක්වීම සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 51 ක් දිවයින පුරා පවත්වන ලදී.

**5. ළමා ශ්‍රමයෙන් තොර කලාප බිහි කිරීමේ වැඩසටහන**

ඉහත වැඩසටහන යටතේ කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් දැනුවත් කිරීමත් ඔවුන් මගින් ග්‍රාම නිලධාරීන් සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සහ පරිවාස නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

මේ හැර වැඩ කරන කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ වැවිලි අංශයේ සේවිකාවන් උදෙසා වැඩකරන කාන්තාවන්ට බලපාන නීති හා සමාජ සංරක්ෂණ නීති පිළිබඳව වැඩසටහන් 8 ක් 2015 වර්ෂයේදී පවත්වා ඇති අතර කර්මාන්ත ශාලා සේවිකාවන් උදෙසා ඉහත මාතෘකාව යටතේ සේවිකාවන්ට සම්මන්ත්‍රණ 19 ක් පවත්වන ලදී. ඊට අමතරව ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි පවත්වනු ලබන මනෝ විද්‍යා උපදේශන වැඩසටහන් 15 ක් පවත්වන ලදී.

කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අවසර ලබාදීම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා ඒකාබද්ධව පරීක්ෂණ 91 ක් සිදුකර ඇත. මීට අමතරව කාන්තා සේවිකා පැමිණිලි අදාළ දිස්ත්‍රික් කාර්යාලය සමග ඒකාබද්ධව විමර්ශණය කරනු ලබන අතර, ප්‍රසූතිකාගාර පැමිණිලි ලද පසු ඒවා පරීක්ෂාකර අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. එමෙන්ම ළමා මෙහෙකාර සේවය පිළිබඳව පැමිණිලි ලද පසු පරීක්ෂණ පැවැත්වීමත් කාන්තා හා ළමා කටයුතු අංශය විසින් 2015 වර්ෂයේදී ඉටුකරන ලද මෙහෙවර ලෙස දැක්විය හැක.

## 06. කර්මාන්තමය සුරක්ෂිතතාව වෙනුවෙන් ඉටුකළ මෙහෙවර

දිවයින පුරා ඇති කර්මාන්තශාලා වල සේවය කරනු ලබන සේවක ප්‍රජාවගේ සුරක්ෂිතතාව, සෞඛ්‍ය හා සුබසාධන තත්ත්වය ආරක්ෂා කිරීමේ අභිප්‍රායයෙන් ක්‍රියාක්මක වන කර්මාන්තමය සුරක්ෂිතතා අංශය ඉහත කී කටයුතු ඉටුකරනු පිණිස සමස්ථ දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් මගින් සිය වැඩසටහන් මෙහෙයවනු ලබයි.

1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත ක්‍රියාවට නංවන අතර පසුකාලීනව කරන ලද පහත සඳහන් සංශෝධනයන්ද සැලකිල්ලට ගනු ලබමින් කර්මාන්තමය සුරක්ෂිතතා අංශය සිය අභිමතාර්ථ නිරන්තරයෙන් ක්‍රියාත්මක කරමින් පවතී.

- 1946 අංක 22 දරණ කර්මාන්තශාලා සංශෝධන පනත
- 1961 අංක 54 දරණ කර්මාන්තශාලා සංශෝධන පනත
- 1976 අංක 12 දරණ කර්මාන්තශාලා සංශෝධන පනත
- 1998 අංක 18 දරණ කර්මාන්තශාලා සංශෝධන පනත
- 2000 අංක 33 දරණ කර්මාන්තශාලා සංශෝධන පනත
- 2002 අංක 19 දරණ කර්මාන්තශාලා සංශෝධන පනත

ඉහත පනත් වල විධිවිධාන අනුව කර්මාන්තමය සුරක්ෂිතතා අංශය මගින් මෙරටෙහි කර්මාන්තශාලා සහ අනෙකුත් සේවා ස්ථානවල සේවයේ යෙදී සිටින්නා වූ සුවහසක් වූ සේවක ප්‍රජාව වෙනුවෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන මෙහෙය පහත පරිදි දැක්විය හැක.

1. කර්මාන්තශාලා පරීක්ෂණ හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම
2. අනතුරු, පැමිණිලි හා අන්තරාදායක සිදුවීම් විමර්ශනය
3. අනතුරු විශ්ලේෂණය
4. කර්මාන්තශාලා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම
5. සේවක ආරක්ෂාව හා සේවක සෞඛ්‍ය පිළිබඳ සේවා සේවක දෙපක්ෂයම දැනුවත් කිරීම
6. අත්‍යවශ්‍ය අවස්ථා වලදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීම
7. අවශ්‍යතාවය අනුව බලයලත් නිලධාරීන් පත්කිරීම

**2015 වර්ෂයේ කර්මාන්තමය සුරක්ෂිතතා අංශය මගින් ඉටුකළ කාර්යභාරය**

| | |
|---|---|
| ලියාපදිංචි කළ මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව | 26,198 |
| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 5,090 |
| කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවන් සංඛ්‍යාව | 28 |
| පිඹුරුපත් අනුමැතිය | 130 |
| පැවැත්වූ දේශන හා සම්මන්ත්‍රණ | 205 |

- කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවන් උදෙසා පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් බොයිලේරු ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධව විශේෂඥ දැනුම හා නිපුණතාවයෙන් හෙබි ඉන්දීය පුහුණු විශේෂඥයින් විසින් පවත්වන ලද බොයිලේරු පුහුණු වැඩසටහන
- අවිස්සාවේල්ල ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේ පැවැත්වූ "ලෝක සුරක්ෂිතතා දිනය" වෙනුවෙන් පැවැත්වූ වැඩමුළුව (2015.04.28)
- අවිස්සාවේල්ල ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේ "ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය" වෙනුවෙන් පවත්වන ලද ජාතික සම්මන්ත්‍රණය (2015.10.13)
- නාරාහේන්පිට කම්කරු ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද වැඩමුළුව (2015.11.17)
- 2015.10.30 බගවන්තලාව ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පවත්වන ලද වැඩමුළුව
- 2015.11.27 දින අනුරාධපුර පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේදී පවත්වන ලද වැඩමුළුව
- සුරක්ෂිතතාව හා සෞඛ්‍යමත්භාවය ප්‍රවර්ධනය කිරීමේ අදිටනින් යුතුව අත්පත්‍රිකා 24,000 ක් මුද්‍රණය කර බෙදාහරින ලදී.

**වෘත්තීය ස්වස්ථතා අංශය**

ශ්‍රී ලංකාව පුරා පවතින විවිධ කර්මාන්තශාලාවල සේවයේ යෙදී සිටින්නාවූ බහුතරයක්වූ සේවක ප්‍රජාවට බලපානු ලබන වෘත්තීයමය ආපදා, වෘත්තීය රෝගාබාධ හා සේවා ස්ථානවල කටයුතු ආශ්‍රිතව පවතින අයහපත් කාර්මික පරිසරය හේතු කොටගෙන ඇතිවන අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් අවම කිරීම මෙම අංශයේ ප්‍රමුඛතම කාර්යභාරය ලෙස සඳහන් කළ හැක.

කිසියම් සේවා ස්ථානයක හෝ කර්මාන්තශාලා පරිශ්‍රයක අනතුරු, උපද්‍රව වලින් තොරව, වෘත්තීයමය සෞඛ්‍ය තත්ත්වය මනා ලෙස සුරැකෙන සේවා පරිසරයක් ස්ථාපිතව පැවතීම මත එම සේවා ස්ථානයේ සේවයේ යෙදී සිටින සේවක ප්‍රජාවගේ වෘත්තීය ස්වස්ථතාව යහපත් තත්ත්වයට පත්වන අතර එමගින් ඇතිවන්නා වූ ධනාත්මක හිතකර තත්ත්වය හේතු කොටගෙන සේවක කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ යෑම මගින් එම කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉහළ යන අතර එහි අවසාන ප්‍රතිඵලය වන්නේ අදාළ කර්මාන්තශාලාවේ ලාභය වර්ධනය වීම වන අතර, සේවා සපයන ආයතන වලටද මෙම තත්ත්වය පොදු වූවකි.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය නෛතික අවශ්‍යතාවයක් වන අතර ඉහත දැක්වූ පරමාර්ථයන් සාධනය කරගනු පිණිස වෘත්තීය ස්වස්ථතා අංශය මගින් වැදගත් පියවරයන් රැසක් ක්‍රියාවට නගා ඇත.

**ආපදා තක්සේරුකරණය**

වෘත්තිය ස්වස්ථතා අංශය මගින් සේවා ස්ථාන ආශ්‍රිත පවතින වෘත්තීය උවදුරු ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව තක්සේරු කරනු ලබන අතර දිවයින පුරා පිහිටුවා ඇති සේවා ස්ථානවල සිදුකරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතුවලදී හඳුනාගනු ලබන එම සේවා ස්ථානවල පවතින අවදානම්කාරී තත්ත්වයන් පිළිබඳව මූලික විමර්ශනයක් සිදුකිරීම හා ඉන් අනතුරුව විද්‍යාත්මක ක්‍රමවේදයන් ආශ්‍රිතව සිදුකරනු ලබන විමර්ශන මගින් මෙම ආපදා පිළිබඳව ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව නිර්ණය කරනු ලබයි.

**පාරිසරික මිනුම්**

දිවයින පුරා පිහිටුවා ඇති සේවා ස්ථානවල පරිසරයේ පවතින භෞතික හා රසායනික ආපදා සම්බන්ධව තීරණ ගැනීම සම්බන්ධයෙන් ඒ පිළිබඳව භාවිතයේ පවතින සූක්ෂම මිනුම් උපකරණ භාවිතයට ගනු ලබන අතර මෙම සේවය නොමිලයේ පිරිනැමීම සිදු කරනු ලබයි. මෙම පරීක්ෂණ වලට අදාළව ඇතැම් පරීක්ෂණ සේවා ස්ථානවල තුළදීම සිදු කරනු ලබන අතර ඇතැම් පරීක්ෂණ වලට අදාළ විශ්ලේෂණය සඳහා නියැදි රසායනාගාර කරා ගෙනැවිත් සිදු කරනු ලබයි. උෂ්ණත්වය, ආලෝකය, ශබ්දය, දූවිලි, දුමාර, වායු හා වාෂ්ප මට්ටම් ප්‍රමාණ පිළිබඳ පරීක්ෂණ නිතිපතා මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

**ජීව විද්‍යාත්මක පරීක්ෂණ**

සේවා ස්ථානවල පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් හේතුවෙන් ඇතිවන ලෙඩ රෝග වැළැක්වීම මෙම ජීව විද්‍යාත්මක පරීක්ෂණවල මූලික අභිමතාර්ථයයි. එමෙන්ම සේවා ස්ථාන ආශ්‍රිතව සිදුවන සෞඛ්‍යමය උපද්‍රවයන් අවම කරගැනීමට අවශ්‍යතාවය පවතින සේව්‍යයන් විසින් කරනු ලබන ඉල්ලීමකට පසු මෙම අංශයේ සේවය ලබාදීමට නිරන්තරයෙන් බලාපොරොත්තුව පසුවේ.

**පෙනහළු ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂණ**

විශේෂයෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන් ආශ්‍රිතව සේවයේ යෙදෙන සේවකයන් සම්බන්ධව මෙම පරීක්ෂණ වාර්ෂිකව සිදු කරනු ලබයි.

1. ඇස්බැස්ටස් හා සිමෙන්ති කර්මාන්තය
2. රෙදි විවීමේ කර්මාන්තය
3. බහුල ලෙස රසායනික ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්ත
4. මිනිරන් පතල් ආශ්‍රිත කර්මාන්තය

ජාතික වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ සතිය
සෑම වර්ෂයකම ඔක්තෝබර් මස දෙවැනි සතිය ජාතික වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ සතිය ලෙස නම් කර ඇති හෙයින් ඊට අදාළ වැඩසටහන් පැවැත්වීමද මෙම අංශයේ මෙහෙවරට අයත් වේ.

**2015 වර්ෂයේදී වෘත්තීය ස්වස්ථතා අංශය මගින් සමස්ත කර්මාන්ත පරිසරය යහපත් අයුරින් පවත්වා ගැනීමට ඉටුකරන ලද මෙහෙය**

| | | |
|---|---|---|
| 1. | කර්මාන්තශාලා තුළ පැවැත්වූ ස්ථානීය මිනුම් පරීක්ෂණ | 228 |
| 2. | රසායනාගාර තුළ පැවැත්වූ පරීක්ෂණ | 235 |
| 3. | පෙනහළු ක්‍රියාකාරීත්වය ආශ්‍රිත පරීක්ෂණ | 857 |
| 4. | ශබ්ද දූෂණය පිළිබඳව සිදු කරන ලද පරීක්ෂණ | 605 |
| 5. | හැසිරීම පාදක වූ ආරක්ෂාව මත සිදු කරන ලද පුහුණුවීම් හා අධ්‍යාපන වැඩසටහන් | |
| | කර්මාන්තශාලා කළමනාකරුවන් | 725 |
| | අධීක්ෂණ නිලධාරින් | 1,245 |
| | කර්මාන්තශාලා කම්කරුවන් | 3,410 |

6. සේවක අර්ථසාධක අරමුදල් හා සම්බන්ධ වෛද්‍ය මණ්ඩල පරීක්ෂණ 600
7. සේවයේ යෙදී සිටියදී අනතුරට පත් වූ සේවකයන් වෙනුවෙන් කම්කරු වන්දි උසාවියේ 9 වතාවක් පෙනී සිටීම.
8. අකර්මණ්‍ය වූ සේවකයන් 520 ක් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට කරුණු ඉදිරිපත් කිරීම.
9. කටුනායක වෙළඳ කලාපයේ සේවකයන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
10. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය වෙනුවෙන් සිලෝන් බිස්කට් ආයතනයේ වැඩසටහන් පැවැත්වීම.

# 07. සැලසුම්, පර්යේෂණ, පුහුණු, ප්‍රකාශන සහ සංඛ්‍යාලේඛන

### සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින අංශ අතුරෙන් අත්‍යාවශ්‍ය වූ සක්‍රීය සේවයක් ඉටු කරනු ලබන අංශයක් ලෙස සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය හැඳින්විය හැකි අතර ශ්‍රී ලාංකීය කම්කරු ප්‍රජාවගේ සුභසාධනය මෙන්ම ඵලදායිතාවය ඉහළ නැංවීම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ යුතු විවිධ ව්‍යාපෘති පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීමත් එම අංශ මගින් යෝජිත ව්‍යාපෘති යෝජනා යළි සකසා ශක්‍යතාවයෙන් යුත් ව්‍යාපෘති මුදල් මූලාශ්‍ර වෙත ඉදිරිපත් කිරීමත් අනුමත වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විවිධ සහය ලබාදීමටත් ප්‍රගති පාලනය හා මෙහෙයුම් හා ඇගයීම් කටයුතු කරමින් එම ව්‍යාපෘති ඉලක්කගත පරිදි නියමිත කාලය තුළ නිමකිරීමත් අපේක්ෂිත ප්‍රතිලාභ සාධනය කරගැනීමත්, කාලීන අවශ්‍යතාවයන් ප්‍රකට කරනු ලබන පර්යේෂණ මාතෘකා ඇසුරෙන් සිදුකිරීමත් එමගින් ලබන නිගමන හා දත්ත ප්‍රකාශනයට පත් කිරීමත්, සජීවී කම්කරු ක්ෂේත්‍රයට සක්‍රීය අයුරින් මුහුණදිය හැකි දැනුවත් භාවයෙන් හා නව තාක්ෂණික දැනුමෙන් සපිරි නිලධාරි පන්තියක් බිහිකිරිමෙහිලා අවශ්‍ය පුහුණුවීම් හා දැනුවත් භාවය ලබා දීමත් සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ මෙහෙවර ලෙස දැක්විය හැක.

### 2015 වර්ෂයේදී මෙම අංශය ඉටුකල කාර්යභාරය

සැලසුම් අංශය මගින් දෙපාර්තමේන්තුවේ සියළු අංශ හා කලාප, දිස්ත්‍රික් හා උප කාර්යාල ආශ්‍රිතව ඉටු කළ යුතු රාජකාරි හා සංවර්ධන වැඩසටහන් පිළිබඳව වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාකාරි සැලසුම් සකස් කර එම වැඩසටහනට අදාළව 2015 වර්ෂයේදී ඉටුකල සංවර්ධන වැඩසටහන් අතරට සුනිසි මෙහෙවර ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 9.636 ක් අනුමත වූ අතර ඒ යටතේ ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කර අවසන් කරන ලදී. මීට අමතරව වෙනත් ආයෝජන නමැති මුදල් මූලාශ්‍රය යටතේ රුපියල් මිලියන 1.8 ක් වියදම් කර ව්‍යාපෘති 3 ක් නිම කරන ලදී.

### සංඛ්‍යාලේඛන අංශය

දිවයින පුරා පිහිටුවා ඇති කර්මාන්ත ශාලා හා සේවා ස්ථාන වල සේවයේ යෙදී සිටින පෞද්ගලික හා අර්ධරාජ්‍ය අංශයේ සේවක පිරිස පාදක කරගත් කාලීන හා විශ්වාසනීය දත්ත හා තොරතුරු සැලසුම් සම්පාදකයින් පර්යේෂකයන් හා කම්කරු දත්ත ප්‍රයෝජනයට ගනු ලබන මෙම අංශය මගින් කම්කරුදෙපාර්තමේන්තුවට අදාළ දත්ත හා තොරතුරු ඇතුළත් සංඛ්‍යාලේඛණ රැස්කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත්කිරීම සිදුකරනු ලබයි.

**සංඛ්‍යාලේඛණ අංශයේ 2015 වර්ෂයේ ඉටුකළ ප්‍රධාන කටයුතු**

- **වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය**

වර්ෂ 1971 සිට සෑම වසරකම ජුනි මාසයේ පවත්වනු ලබන මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ දිවයිනේ පරිපාලනමය, මූල්‍යමය හා ක්‍රමසම්පාදන අවශ්‍යතා සඳහා ඉවහල්වන සංඛ්‍යා දත්තයන් රැස්කිරීමය. 2015 වර්ෂය සඳහා වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය මේ වන විට ආරම්භ කර ඇත.(2015.03.15 දිනට පැවති තත්ත්වය)

❖ සාමාන්‍ය ඉපැයීම් හා වැඩ කළ පැය ගණන පිළිබඳ සමීක්ෂණය

පඩිපාලක සභා මගින් අවම වැටුප් නියමකර ඇති කර්මාන්ත ආයතනවල සේවය කරන සේවකයින්ගේ මාසික සාමාන්‍ය ඉපැයීම් හා වැඩ කරන පැය ගණන පිළිබඳ දත්ත රැස්කිරීම මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු වේ. මෙම සමීක්ෂණයට අදාළව මාර්තු සමීක්ෂණයට අදාළව මාර්තු සමීක්ෂණය අවසන් කර ඇති අතර 2015 සඳහා වන සාමාන්‍ය ඉපැයීම් හා වැඩ කළ පැය පිළිබඳව සමීක්ෂණ වාර්තාව 2016 දී පළමු කාර්තුව තුළදී ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.

❖ අවම වැටුප් දර්ශකාංකය සකස් කිරීම

පඩිපාලක සභා යටතේ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලබන අවම වැටුප් හා ඒවායේ කාලීන සංඛ්‍යාලේඛණ පදනම් කරගෙන මාසිකව මෙම දර්ශක ගණනය කරනු ලැබේ. මේ සම්බන්ධව වසර 10 ක් තුළ අවම වැටුප් දර්ශක පිළිබඳ සංඛ්‍යාලේඛණ සැකසීමත් ඒවා ප්‍රසිද්ධියට පත් කිරීමත් සංඛ්‍යාලේඛණ අංශයේ 2015 වර්ෂයේ කාර්යභාරය ලෙස දැක්විය හැක.

❖ කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය

කම්කරු දෙපාර්තමේන්තුව යටතේ පිහිටා ඇති සංඛ්‍යාලේඛණ අංශය මගින් වාර්ෂිකව එළිදැක්වන දත්ත හා තොරතුරු ඇතුළත් කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය එළි දැක්වීම සිදුකර ඇත.

## 08. කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගනු පිණිස දෙපාර්තමේන්තුව සතු විවිධ අංශ නිසි ඉලක්ක ගතව මෙහෙයවීම පිණිස කටයුතු සිදුකරනු ලබන්නේ පාලන අංශය මගින් වන අතර මෙම අංශයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ දෙපාර්තමේන්තුව සතු මානව සම්පත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කර දෙපාර්තමේන්තුවට අවශ්‍ය යටිතල පහසුකම් මෙන්ම භෞතික සම්පත් ප්‍රමාණාත්මකව හා ගුණාත්මක වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම ලෙස දැක්විය හැක.

**මානව සම්පත් සංවර්ධනය**

දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින සේවක ප්‍රජාවගේ වෘත්තීය සංවර්ධනය මෙන්ම සේවක පුරප්පාඩු පිරවීම භාරව කටයුතු කරනු ලබන "පාලන අංශය" මගින් ඉටුකරනු ලබන්නේ කෘතහස්ත සේවාවකි.

මානව සම්පත් සංවර්ධනය අරබයා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් නිලධාරීන් උදෙසා විදේශ පුහුණුව ලබාදීමට පියවර ගෙන ඇත.

| තනතුර | පුහුණු සංඛ්‍යාව |
|---|---|
| අතිරේක කම්කරු කොමසාරිස් | 01 |
| කම්කරු කොමසාරිස් | 04 |
| නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | 04 |
| සහකාර කම්කරු කොමසාරිස් | 06 |
| ගණකාධිකාරී | 01 |
| විශේෂඥ කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු | 01 |
| සංඛ්‍යාන නිලධාරී | 01 |

**කම්කරු දෙපාර්තමේන්තුව වෙත 2015 වර්ෂය තුළ නව බඳවාගැනීම්**

දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නව බඳවාගැනීම්

| | |
|---|---|
| නීති නිලධාරී | 05 |
| කාර්යාල සේවා සේවක | 20 |

**ඒකාබද්ධ සේවයේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි නව පත්වීම් ලෙස දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම්**

සහකාර කම්කරු කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) 06
රාජ්‍ය කළමනාකරණ සහකාර 219

**භෞතික සම්පත් සංවර්ධනය**

**ඉංජිනේරු හා ගොඩනැගිලි නඩත්තු ඒකකය**

දෙපාර්තමේන්තුව සතු තවත් එක් සක්‍රීය අංශයක් ලෙස හඳුන්වා දිය හැකි ඉංජිනේරු හා ගොඩනැගිලි නඩත්තු ඒකකය, දෙපාර්තමේන්තුව සතු සියළු ගොඩනැගිලි ඉතා යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාමටත් නව ගොඩනැගිලි අවශ්‍යතා සපුරාලීමට දරන ප්‍රයත්නය ප්‍රශංසනීය වේ.

ගොඩනැගිලි නඩත්තු අංශයේ වර්තමානයේ ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යය ලෙස දැක්විය හැක්කේ ''මෙහෙවර පියස'' නම් කම්කරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉදිකරනු ලබන මහල් 36 කින් හෙබි දැවැන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම වන අතර 2015 අවසානය වන විට මෙම දැවැන්ත ගොඩනැගිල්ලේ 17 වැනි මහල දක්වා ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවතින.

මීට අමතරව ගොඩනැගිලි නඩත්තු අංශය මගින් 2015 දී ඉටුකළ මෙහෙවර පහත පරිදි ලඝුකර දැක්විය හැක.

| | ඉදිකරනු ලබන ගොඩනැගිල්ල | 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල (රු. `000) | 2015.12.31 දිනට වැයකල මුදල |
|---|---|---|---|
| 1 | යාපනය | 23,000 | 23,000 |
| 2 | අවිස්සාවේල්ල | 20,000 | 20,000 |
| 3 | මුලතිව් | 25,000 | 25,000 |
| 4 | මීගමුව | 25,000 | 25,000 |
| 5 | බෙලිඅත්ත | 30,000 | 30,000 |
| 6 | කිලිනොච්චිය | 25,000 | 25,000 |
| 7 | පොලොන්නරුව | 25,000 | 25,000 |
| 8 | පුත්තලම | 10,000 | 10,000 |
| 9 | අනුරාධපුරය | 5,000 | 2,269 |
| 10 | කුරුණෑගල | 30,000 | 30,000 |




මෙහෙවර පියස

**පුස්තකාලය හා කම්කරු කෞතුකාගාරය**

කම්කරු දෙපාර්තමේන්තුව සතු පුස්තකාලය මගින් 2015 වර්ෂයේදී ඉටුකළ කාර්යභාරය ලෙස ප්‍රමුඛස්ථානය ලැබෙන්නේ පුස්තකාල සංචිතය ප්‍රවර්ධනය කිරීම, පුස්තකාල පහසුකම් හා තොරතුරු සැපයීම, ශාඛා පුස්තකාල වැඩිදියුණු කිරීම, දත්ත කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුව සතු ප්‍රකාශන කමිටු හා වෙබ් කමිටුවේ කටයුතු ඉටුකිරීම, පොත් අලෙවි කිරීම, ඡායා පිටපත් සේවය පවත්වා ගෙන යාම දැක්විය හැකිය.

1923 වර්ෂයේදී ආරම්භ කරන ලද ඉන්දීය ආගාමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුවෙන් ඇරඹි කම්කරු දෙපාර්තමේන්තුවට අදාළ එදා මෙදා තුර වැදගත් වන කෞතුක භාණ්ඩ, ලියකියවිලි යනාදී වටිනා කෞතුක භාණ්ඩ රැසකින් සපිරි ශ්‍රී ලංකාවේ පවතින කම්කරු ක්ෂේත්‍රයට අදාළ එකම කෞතුකාගාරය වඩාත් සංවිධිතව පවත්වාගෙන යාමත් පුස්තකාලය හා බැඳී පවතින රාජකාරි ලෙස දැක්විය හැකිය.

**මූල්‍ය අංශය**

කම්කරු දෙපාර්තමේන්තුව සතු තවත් සක්‍රීය අංශයක් ලෙස මූල්‍ය අංශය හැඳින්විය හැකි අතර දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සියළු කටයුතු උදෙසා ඇස්තමේන්තුගත වියදම් ඒ ඒ අංශ මගින් ලබාගෙන විධිමත්ව ඇස්තමේන්තු ගතකර පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් ලෙස වර්ගීකරණයට ලක්කර මුදල් අමාත්‍යාංශය වෙත ලබාදීමත් එමගින් අනුමත වන මුදල් ශීර්ෂයක ඇස්තමේන්තුගත වියදම් නොඉක්මවන ලෙස වැය කිරීමත් මුදල් අංශයේ කාර්යභාරය ලෙස සැකෙවින් දැක්විය හැක.

## සංඛ්‍යාලේඛන සංග්‍රහය

කාර්මික සම්බන්ධතා අංශය

| | | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| කාර්මික ආරවුල් පිළිබඳ සංඛ්‍යාලේඛන | | | | | |
| | වාර්තා වූ සංඛ්‍යාව | 3,702 | 3,204 | 2,948 | 1,561 |
| | විසඳූ සංඛ්‍යාව | 3,695 | 3,077 | 2,903 | 1,493 |
| ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව | | 43 | 34 | 50 | 40 |
| වෘත්තීය සමිති කටයුතු | | | | | |
| | ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | 114 | 108 | 125 | 181 |
| | අවලංගු කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | 02 | 114 | 255 | 315 |
| කාර්මික අධිකරණ කටයුතු | | | | | |
| | අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම | 43 | 49 | 53 | 28 |
| | ප්‍රධාන නිකුත් කිරීම | 26 | 35 | 42 | 35 |
| වැඩවර්ජන වාර්තා වීම පිළිබඳ සංඛ්‍යාලේඛණ | | | | | |
| වැඩවර්ජන වාර්තා වීම | වතු | 14 | 22 | 31 | 20 |
| | ආයතන | 20 | 20 | 07 | 16 |
| සහභාගි වූ සේවක සංඛ්‍යාව | වතු | 4,338 | 5,031 | 4,833 | 5,229 |
| | ආයතන | 5,626 | 6,088 | 1,618 | 3,171 |
| අහිමි වූ මිනිස් දින ගණන | වතු | 25,043 | 41,669 | 29,165 | 29,743 |
| | ආයතන | 10,774 | 38,754 | 8,158 | 8,630 |
| සේවය අවසන් කිරීමේ අංශයේ කටයුතු | | | | | |
| | පැමිණිලි යොමු වූ සංඛ්‍යාව | 92 | 134 | 149 | 171 |
| | පැමිණිලි විසඳූ සංඛ්‍යාව | 143 | 112 | 148 | 162 |
| සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසර දීම | | 31 | 41 | 51 | 24 |
| සමාජ කතිකාවත පිළිබඳ වැඩසටහන් පැවැත්වීම | | | | | |
| සමාජ කතිකා අංශය මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 153 | 107 | 88 | 80 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 4,751 | 6,560 | 5,433 | 4,403 |
| දිස්ත්‍රික් හා උප කාර්යාල මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 225 | 214 | 199 | 116 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 7,902 | 7,768 | 6,861 | 4,094 |

2015.12.31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති ගණන - 1,907

2015.12.31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සම්මේලන ගණන - 27

නීති ක්‍රියා අංශය

| පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 |
| පාරිතෝෂික ගෙවීම් පනත | 3,404 | 2,371 | 2,044 | 2,524 |
| කාර්මික ආරවුල් පනත | 77 | 126 | 146 | 153 |
| සේවය අවසන් කිරීමේ පනත | 59 | 58 | 36 | 49 |
| පඩිපාලක සභා ආඥා පනත | 290 | 203 | 244 | 282 |
| සාප්පු හා කාර්යාල සේවක පනත | 132 | 112 | 88 | 99 |
| ප්‍රසූතිකාධාර පනත | 02 | 05 | 03 | 03 |
| ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 10 | 07 | 11 | 05 |
| සේවක අර්ථසාධක අරමුදල් පනත | 3,210 | 3,415 | 3,244 | 2,336 |
| කම්කරු විනිශ්චය සභා නියෝග | 165 | 144 | 183 | 164 |
| අයවැය සහන දීමනා පනත | 134 | 22 | 32 | 29 |
| අනුමත අර්ථසාධක අරමුදල් | 07 | 01 | 07 | 03 |

විශේෂ විමර්ශන අංශය

| | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| පැමිණිලි පරීක්ෂණ | 264 | 122 | 216 | 292 |
| ගණනය කරන ලද සේ.අ.අ. හිඟ වටිනාකම (රු. දහස්) | 313,770 | 28,012 | 32,416 | 634,969 |
| ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත මුදල් වටිනාකම (රු. දහස්) | 40,831 | 5,814 | 2,970 | 4,996 |

සේවක අර්ථසාධක අරමුදල් අංශය

| | 2012.12.31 දිනට | 2013.12.31 දිනට | 2014.12.31 දිනට | 2015.12.31 දිනට |
|---|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | 14,559,328 | 15,203,073 | 15,831,410 | **** |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | 198,893 | 204,777 | 210,595 | **** |
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1,144,409 | 1,299,974 | 1,486,931 | 1,664,852 |
| සක්‍රිය සාමාජික සංඛ්‍යාව (මිලියන) * | 2.34 | 2.40 | 2.40 | 2.40 |
| සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව ** | 68,140 | 69,148 | 69,683 | 72,917 |

| | | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| නව ලියාපදිංචි කිරීම් | සේවාදායකයින් | 785,078 | 813,010 | 827,883 | **** |
| | සේවායෝජකයින් | 7,195 | 7,802 | 6,176 | 5,770 *** |
| ප්‍රතිලාභ ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 115,654 | 114,275 | 127,492 | 127,107 |
| | ගෙවූ ප්‍රතිලාභ මුදල (රු. මිලියන) | 48,712 | 50,407 | 65,118 | 77,769 |
| දායක මුදල් රැස් කිරීම (රු. මිලියන) | | 70,171 | 77,335 | 90,049 | 102,453 |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 11,234 | 16,268 | 17,786 | 13,132 |
| | අනුමත කළ ණය මුදල් වටිනාකම (රු. මිලියන) | 3,973 | 6,914 | 8,021 | 5,377 |

* වර්ෂය තුළ එක්වරක් හෝ දායක මුදල් ගෙවන ලද සාමාජික ගිණුම්
** වර්ෂය තුළ එක්වරක් හෝ සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවන ලද සේවායයන්
*** 2015.09.30 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු වේ.
**** දැනට තොරතුරු ලබාගත නොහැක.

කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

| | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව (වර්ෂය අවසාන දිනට) | 22,459 | 23,974 | 25,236 | 26,198 |
| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 6,700 | 6,372 | 5,067 | 5,090 |
| පරීක්ෂකයින් (ඉංජිනේරුවරුන්) සංඛ්‍යාව | 28 | 28 | 30 | 28 |
| පිඹුරුපත් අනුමැතිය | 106 | 97 | 111 | 130 |
| දේශන හා සම්මන්ත්‍රණ | 229 | 218 | 147 | 205 |

වෘත්තීය ස්වස්ථතා අංශය

| | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| කර්මාන්තශාලා පරීක්ෂණ සංඛ්‍යාව | 410 | 352 | 250 | 312 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 137 | 190 | 296 | 204 |

සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය

| | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන් | 04 | 14 | 18 | 36 |
| කළමනාකරණ සහකාර පුහුණු වැඩසටහන් | 08 | 17 | 23 | 16 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 33 | - | 17 | 02 |
| වෙනත් පුහුණු වැඩසටහන් | 02 | 02 | 08 | 11 |
| පශ්චාත් උපාධි පාඨමාලා | 20 | 41 | 81 | 56 |
| බාහිර පුහුණු | 57 | 23 | 18 | 13 |
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | 05 | 06 | 05 | 05 |

මුදල් අංශය

| | | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | ප්‍රතිපාදනය (රු.) | **1,100,630,000** | **1,138,550,000** | **1,411,200,000** |
| | වියදම් (රු.) | **1,016,129,728** | **1,117,107,412** | **1,364,002,819** |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු.) | **760,275,000** | **373,200,000** | **1,705,904,000** |
| | වියදම් (රු.) | **732,936,934** | **306,883,421** | **1,574,171,513** |

ආයතන අංශය

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ සිටි මුළු සේවක සංඛ්‍යාව | 2,219 | 2,169 | 2,256 |
| • දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් | 01 | 32 | 25 |
| • ඒකාබද්ධ සේවයේ නව පත්වීම් ලෙස දෙපාර්තමේන්තුවට පැමිණීම් | 37 | 163 | 219 |
| • ස්ථාන මාරු වීම් (ශුද්ධ) | (01) | (10) | (63) |
| • වෙනත් හේතූන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට එකතු වීම් | - | 05 | 0 |
| • විශ්‍රාම යාම් | 55 | 50 | (26) |
| • වෙනත් හේතූන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් ඉවත් වීම් | 32 | 53 | (6) |
| වර්ෂය අවසානයේ මුළු සේවක සංඛ්‍යාව | 2,169 | 2,256 | 2,405 |

## 2015.12.31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | අනියම් ආදේශක | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | |
| 1. | කම්කරු කොමසාරිස් ජනරාල් | 1 | 1 | | 0 |
| 2. | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ශ්‍රී. ලං. ප. සේ) | 1 | 1 | | 0 |
| 3. | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපා) | 1 | 0 | | 1 |
| 4. | වෛද්‍ය නිලධාරි | 4 | | | 2 |
| | වෛද්‍ය නිලධාරි | | 1 | | |
| | වෛද්‍ය නිලධාරි (පර්යේෂණ) | | 1 | | |
| 5. | කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.) (විදේශ දූත මණ්ඩලවල නිලධාරීන් දෙදෙනෙකු සේවය කරයි) | 6 | 7 | | (1) |
| 6. | කම්කරු කොමසාරිස් (දෙපා) | 2 | 0 | | 2 |
| 7. | කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා ) හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ) | 1 | 1 | | 0 |
| 8. | කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.වි.සේ.) / (ශ්‍රී.ලං.වෛ.සේ) | 1 | 0 | | 1 |
| 09. | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | | 0 |
| 10. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | | 0 |
| 11. | ප්‍රධාන නීති නිලධාරී සහ කම්කරු කොමසාරිස් (නීති ක්‍රියා) | 1 | 0 | 1 | 1 |
| 12 | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ) | 1 | 1 | | 0 |
| 13. | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.) | 15 | 0 | | 15 |
| 14 | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (දෙපා) | 9 | 6 | | 3 |
| 15 | නි. කම්. කො. හා විශේෂඥ පර්යේෂණ නිලධාරි (ශ්‍රී.ලං.වි.සේ.) | 1 | 0 | | 1 |
| 16. | ගණකාධිකාරි | 5 | 4 | | 1 |
| 17. | සහකාර කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.) | 41 | 38 | | 3 |
| 18. | සහකාර කම්කරු කොමසාරිස් (දෙපා) | 63 | 40 | | 23 |
| 19. | නීති නිලධාරි | 14 | 7 | | 7 |
| 20. | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් | 1 | 1 | | 0 |
| 21. | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ශ්‍රී. ලං. ඉං. සේ.) | 3 | 3 | | 0 |
| 22. | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | 10 | 10 | | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 23. | සිවිල් ඉංජිනේරු - (ශ්‍රී.ලං.ඉං.සේ.) | 1 | 0 | | 1 |
| 24. | කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු - (ශ්‍රී.ලං.ඉං.සේ.) | 14 | 12 | | 2 |
| 25. | රසායන ඉංජිනේරු | 2 | 2 | | 0 |
| 26. | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (ශ්‍රී.ලං.වි.සේ.) | 1 | 1 | | 0 |
| 27. | පර්යේෂණ නිලධාරී (ශ්‍රී.ලං.වි.සේ.) | 3 | 3 | | 0 |
| 28. | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.තො.ස.තා.සේ.) | 1 | 0 | | 1 |
| | එකතුව | 205 | 142 | 1 | 63 |
| තෘතීය මට්ටම | | | | | |
| 29 | පුස්තකාලයාධිපති (අධිශ්‍රේණිය) | 1 | 0 | | 1 |
| 30 | තාක්ෂණ නිලධාරී ශ්‍රී.ලං.තා.සේ. විශේෂ පන්තිය | 1 | 0 | | 1 |
| 31 | ඇඟිලි සටහන් පරීක්ෂණ නිලධාරී. (විශේෂ පන්තිය ශ්‍රී.ලං.තා.සේ) | 1 | 0 | | 1 |
| 32 | කම්කරු නිලධාරී (අධිශ්‍රේණිය) | 56 | 0 | | 56 |
| 33 | ලේඛකාධිකාරී | 1 | 1 | | 0 |
| 34 | තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී | 3 | 0 | | 3 |
| 35 | භාෂා පරිවර්තක (සිංහල- ඉංග්‍රිසි) | 2 | 2 | | 0 |
| 36 | භාෂා පරිවර්තක (දෙමළ- ඉංග්‍රිසි) | 1 | 1 | | 0 |
| 37 | භාෂා පරිවර්තක (සිංහල දෙමළ) | 3 | 0 | | 3 |
| 38 | පරිපාලන නිලධාරී | 2 | 1 | | 1 |
| 39 | කම්කරු නිලධාරී | 597 | 395 | | 202 |
| | එකතුව | 668 | 400 | 0 | 268 |
| ද්විතීය මට්ටම | | | | | |
| 40 | ක්ෂේත්‍ර නිලධාරී | 10 | 10 | | 0* |
| 41 | මානව සම්පත් සංවර්ධන නිලධාරී | 69 | 69 | | 0* |
| 42 | සංවර්ධන නිලධාරී | 96 | 0 | | 96 |
| 43 | තාක්ෂණ නිලධාරී (සිවිල්) | 1 | 0 | | 1 |
| 44 | තාක්ෂණ නිලධාරී (විදුලි) | 1 | 1 | | 0 |
| 45 | ඇඟිලි සටහන් පරීක්ෂණ නිලධාරී | 5 | 4 | | 1 |
| 46 | පර්යේෂන සහකාර | 4 | 0 | | 4 |
| 47 | ගොඩනැගිලි පරීක්ෂක | 4 | 0 | 1 | 4 |
| 48 | සැලසුම් ශිල්පි | 3 | 2 | | 1 |
| 49 | පුස්තකාලයාධිපති | 4 | 3 | | 1 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 50 | කළමනාකරණ සහකාර සේවය | 1527 | 1299 | | 228 |
| 51 | ලිපිකරු(සේ. අ. අ. ) | 19 | 19 | | 0* |
| 52 | ලඝුලේඛක | 10 | 8 | 1 | 2 |
| 53 | පරිඝනක යන්ත්‍ර ක්‍රියාකරු | 0 | 0 | | 0* |
| 54 | ස්ථානභාර නිලධාරි | 4 | 3 | | 1 |
| 55 | නේවාසිකාගාර පාලිකා | 4 | 3 | | 1 |
| 56 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 9 | 7 | | 2 |
| 57 | ප්‍රවාහන නිලධාරි | 1 | 1 | | 0 |
| එකතුව | | 1771 | 1429 | 2 | 342 |
| ප්‍රාථමික මට්ටම | | | | | |
| 58 | රියදුරු | 82 | 76 | | 6 |
| 59 | විදුලි කාර්මික | 2 | 2 | | 0 |
| 60 | යන්ත්‍ර කාර්මික | 1 | 1 | | 0 |
| 61 | වඩු කාර්මික | 1 | 1 | | 0 |
| 62 | පයිප්ප වැද්දුම්කරු | 1 | 1 | | 0 |
| 63 | සංචාරක බංගලා භාරකරු | 5 | 4 | | 1 |
| 64 | කාර්යාල කාර්ය සහයක | 350 | 299 | | 51 |
| 65 | මුරකරු | 40 | 44 | | (4) |
| 66 | ලොරි පවිත්‍රකරු | 1 | 1 | | 0 |
| එකතුව | | 483 | 429 | 0 | 54 |
| **මුළු එකතුව** | | **3127** | **2400** | **3** | **727** |

- රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවන්හි සීමාවන් තුල සේවක සංඛ්‍යා ගැලපීම නිර්දේශ කිරීම යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/08/36/01-Vol 1 හා 2012.11.30 දිනැති ලිපියෙන් කම්කරු දෙපාර්තමේන්තුව සඳහා අනුමත කරන ලද නව කාර්ය මණ්ඩලය අනුව මෙම තනතුරු, තනතුර දරන්නාට පෞද්ගලිකවන සේ හා පසුව අහෝසි වීමට යටත්ව ලබාදී ඇත.

ඇමුණුම

# කම්කරු දෙපාර්තමේන්තුවේ සංවිධාන සැකැස්ම

